සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
Department of Samurdhi Development

කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය
மகளிர் சிறுவர் அலுவல்கள் மற்றும் சமூக வலுவூட்டல் அமைச்சு
Ministry of Women, Child Affairs and Social Empowerment

මගේ අංකය / எனது இல / My No: DSD/HO/09/CBO/05/ක්‍රීඩා
ඔබේ අංකය / உமது இல / Your No: ........................
දිනය / திகதி / Date: 2024.05.13

සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන්/ දිස්ත්‍රික් සමෘද්ධි අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන්,

සියළුම දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂවරුන්,

සියළුම දිස්ත්‍රික් සමෘද්ධි නියෝජ්‍ය හා සහකාර අධ්‍යක්ෂවරුන්,

සියළුම විෂයභාර දිස්ත්‍රික් ප්‍රජාමූල හා සමාජ සංවර්ධන විෂය භාර කළමණාකරුවන්,

සියළුම ප්‍රජාමූල සමිති කළමණාකරුවන්,

සියළුම බැංකු කළමණාකරුවන්,

සියළුම සමාජ සංවර්ධන සහකාරවරුන් / ප්‍රජාමූල විෂය භාර සංවර්ධන නිලධාරින් වෙත.

**<u>"මතට දුම්වැටියට තබමු තිත සුමිතුරු - සවි බලැති දේශයක් ගොඩ නගමු නිරතුරු"</u>**

**<u>ජාත්‍යන්තර දුම්වැටි හා මත් විරෝධී දිනය - 2024</u>**

උක්ත හිසින් යුත් සමෘද්ධි චක්‍රලේඛ ජාත්‍යන්තර දුම්වැටි හා මත් විරෝධී දිනය 2024/08 හා 2024.05.07 දිනැති චක්‍රලේඛයට එකතුවකි.

02. ඒ අනුව 2024 වසරේ ජාත්‍යන්තර දුම්වැටි හා මත් විරෝධී දින සමෘද්ධි කොඩි වැඩසටහනට පූර්ව ප්‍රචාරයක් ලබාදීම සඳහා **"මත් විරෝධී සමෘද්ධි මාර්ග ධාවන තරඟය "** පැවැත්වීමට අවශ්‍ය මූලික තරඟ පැවැත්වීම සඳහා අදාල උපදෙස් මාගේ සමාංක හා 2024.04.09 දිනැති "සිංහල හා හින්දු අලුත් අවුරුදු ගණුදෙනු චාරිත්‍රයට සමගාමීව සමෘද්ධි බැංකුවල ඉතුරුම් ප්‍රවර්ධන වැඩසටහන - 2024 " ලිපිය මඟින් ලබා දී ඇත. එම උපදෙස් අනුව බැංකු මට්ටමින් සංවිධානය කළ සිංහල හා හින්දු අළුත් අවුරුදු උත්සවයේ දී පවත්වන ලද මාර්ග ධාවන තරඟයේ ජයග්‍රාහකයා (ප්‍රථම ස්ථානය) පිළිබඳ තොරතුරු ඇමුණුම් අංක 01 ආකෘතියට අනුව ප්‍රජාමූල බැංකු සමිතිය හරහා දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ වෙත 2024.05.17 දිනට පෙර ලබා දිය යුතුය. ඔබ දිස්ත්‍රික්කයේ සමෘද්ධි බැංකු අළුත් අවුරුදු උත්සවයන් හි මාර්ග ධාවන තරගයේ ප්‍රථම ස්ථානය දිනා ගත් ක්‍රීඩකයින්ගේ සහභාගීත්වයෙන් මැයි 31 දින ජාත්‍යන්තර දුම්වැටි හා මත් විරෝධී දින සමෘද්ධි කොඩි වැඩසටහනේ සමාරම්භය සනිටුහන් කරමින් පෙ.ව. 8.00ට පෙර "මත් විරෝධී සමෘද්ධි මාර්ග ධාවන තරඟය" ආරම්භ කළ යුතුය.

03. තරඟය සංවිධානය කිරිමට අදාල උපදෙස්

- තරඟය පැවැත්විම සඳහා දිස්ත්‍රික්කයේ කේන්ද්‍රස්ථානය තෝරා ගැනීම . ඊට අදාල බැංකු සමිතිය හා ක්‍රීඩා අනුකම්ටුවේ සහයෝගය ලබා ගැනීම
- 

1වන අදියර,4 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල. /1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல /1st Step, 4 th floor, Sethsiripaya Battaram

| | අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் தலைமையதிபதி / Director General | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පාලන හා ආයතන) / மேலதிக பணிப்பாளர் தலைமையதிபதி ( நிர்வாகம்/தாபனம்) / Additional Director General (Admin & Establishment) | ප්‍රධාන ගණකාධිකාරී / பிரதான கணக்காளர் / Chief Accountant | අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය) / பணிப்பாளர் (குறு நிதி ) / Director ( Micro Finance) | කාර්යාලය / அலுவலகம் / Office |
|---|---|---|---|---|---|
| Tel- | 011-2872202 | 011-2873799 | 011-2869742 | 011-2889003 | 0112872202 |
| Fax - | 011-2889002 | 011-2873996 | 011-2869742 | 011-2887469 | |
| E-mail- | dgsamurdhi@gmail.com | diradmin@samurdhi.gov.lk | finance@samurdhi.gov.lk | | |
| | | **Hot Line :0112-889007** | | **Hot Line:0112-885582** | **Hot Line: 011- 28** |

- සියළුම ක්‍රීඩකයින් සෞඛ්‍ය ආරක්ෂිත බව සනාථ කිරීම සඳහා පිළි ගත් වෛද්‍යවරයෙකුගේ නිර්දේශ සහිත වෛද්‍ය වාර්තාව
- ස්ථානීය වෛද්‍යවරයෙකු සම්බන්ධ කර ගැනීම හා අනෙකුත් සෞඛ්‍ය පහසුකම් සලසා ගැනීම.
- දිස්ත්‍රික් ක්‍රීඩා නිලධාරි හා ප්‍රාදේශීය ක්‍රීඩා නිලධාරිගේ (තරඟය පැවැත්වෙන බල ප්‍රදේශයට අයත්) ප්‍රධානත්වයෙන් තරඟය සංවිධානය කිරීම. මෙහි දී දුර ප්‍රමාණය තීරණය කිරීම. තරඟ විනිශ්චය, පෝෂණ කලාප හා ආරක්ෂාව ඇතුළු වෙනත් කාර්යයන් සම්බන්ධව සැලසුම් කිරීම. ( අවම දුර ප්‍රමාණය කි.මී.10කි)
- ශ්‍රී ලංකා පොලිසිය ඇතුළු රාජ්‍ය, පෞද්ගලික හා රාජ්‍ය නොවන සංවිධාන වල සහයෝගය ලබා ගැනීම
- විද්‍යුත් , මුද්‍රිත හා සමාජ මාධ්‍ය භාවිතා කරමින් පුළුල් මාධ්‍ය ප්‍රචාරයක් ලබාදීම. මෙහිදී දුම්වැටි හා මත්ද්‍රව්‍ය භාවිතයේ ආදීනව අර්ථ ගැන්වෙන ආකාරයෙන් නිර්මාණාත්මකව ප්‍රචාරක කටයුතු සංවිධානය කිරීම.
- මැතිවරණ කොමසාරිස් විසින් කාන්තා ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශ ලේකම් වෙත යොමු කර ඇති අංක EC/RDR/2024/1A-400 හා 2024.04.25 දිනැති ලිපියෙන් ලබාදී ඇති උපදෙස් අනුව මැතිවරණ නිති කිසිවක් උල්ලංඝන නොවන පරිදි තරඟය පැවැත්වීමට කටයුතු සංවිධානය කිරීම. මේ සම්බන්ධයෙන් ඔබ දැනුවත් කර ඇත.

04. මුල්‍ය ප්‍රතිපාදන වෙන් කිරීම හා ත්‍යාග ලබාදීම

මත් විරෝධී සමෘද්ධි මාර්ග ධාවන තරඟය පැවැත්වීම සඳහා සමෘද්ධි ජාතික සමාජ සංවර්ධන අරමුදලින් මුදල් වෙන් කර ඇත. ඒ අනුව දිස්ත්‍රික්කයක් සඳහා රුපියල් 50,000/= ක් හා බැංකු 10ට වැඩි දිස්ත්‍රික්ක සඳහා එක් බැංකු සංගමයක් සඳහා රුපියල් 1,000/= ක් බැගින් මුදල් වෙන් කර ඇති අතර, ඒ සම්බන්ධ විස්තර ඇමුණුම් අංක 02 හි දක්වා ඇත.

දිස්ත්‍රික් මාර්ග ධාවන තරගයේ දී ප්‍රථම , දෙවන , තෙවන, සිව්වන හා පස්වන ස්ථානය දක්වා ජයග්‍රාහකයින් තෝරා ගන්නා ලෙසත්, ඔවුන් සඳහා පහත ආකාරයෙන් ත්‍යාග ලබාදිමට කටයුතු කළ යුතුය.

- ප්‍රථම ස්ථානය - රු. 15,000/=
- දෙවන ස්ථානය - රු. 10,000/=
- තෙවන ස්ථානය - රු. 7,500/=
- සිව්වන හා පස්වන ස්ථානය - රු. 5,000/=

මීට අමතරව පෞද්ගලික හා රාජ්‍ය නොවන සංවිධානවල සහයෝගය ලබා ගෙන ත්‍යාග ප්‍රමාණය වැඩි කිරීමට කටයුතු සංවිධානය කරන්නේ නම් මැනවි. ජයග්‍රාහී තරඟකරුවන් සඳහා සහතික පත් නිකුත් කිරීම සම්බන්ධව පසුව දැනුවත් කරනු ලැබේ.

05. වෙනත්

5.1 අවුරුදු උත්සවයේ මාර්ග ධාවන තරඟයේ ප්‍රථම ස්ථානය දිනා ගත් තරඟකරු අනිවාර්යෙන් සහභාගී විය යුතු අතර, මාර්ග ධාවන තරඟයේ තරඟකාරි බව වර්ධනය කිරීම සඳහා වැඩි තරඟකරුවන් ප්‍රමාණයක් සහභාගී කරවීමට සුදුසු ක්‍රමවේදයක් දිස්ත්‍රික් මට්ටමින් සකසා ගත හැක.

5.2 ජාත්‍යන්තර දුම්වැටි හා මත් විරෝධී දිනය 2024/08 සමෘද්ධි චක්‍රලේඛයේ උත්සව හා විශේෂිත වැඩසටහනහි අංක X හි ලබා දී ඇති උපදෙස් අනුව මැරතන් ධාවන තරඟය පැවැත්වෙන ස්ථානයන්හි මැරතන් ධාවන තරඟය සඳහා ප්‍රචාරයක් ලබාදීමට බැනර් ප්‍රදර්ශනය කිරීම.

5.3 මෙම මැරතන් ධාවන තරඟය සංවිධානය කිරීම සඳහා 2024.05.22 දිනට පෙර ඔබගේ ප්‍රධානත්වයෙන් අවශ්‍ය නිලධාරින්, සභය ආයතන නියෝජිතයින් සමඟ සාකච්ඡාවක් සංවිධානය කිරීම.

5.4 මත් විරෝධී සමෘද්ධි  මාර්ග ධාවන තරඟයේ ජාතික තරඟය  පැවැත්වීම සම්බන්ධ තොරතුරු පසුව දැනුම් දෙන අතර, දිස්ත්‍රික් තරඟයේ ප්‍රථම, දෙවන හා තෙවන ස්ථාන දිනා ගත් තරඟකරුවන් පිළිබඳ වාර්තාව ඇමුණුම් අංක 03 අනුව සකස් කර ජුනි 15 දිනට පෙර ප්‍රජාමූල සංවිධාන හා ක්‍රීඩා අංශයට එවිය යුතුය.

5.5 "මත් විරෝධී සමෘද්ධි  මාර්ග ධාවන තරඟය" දිස්ත්‍රික් මට්ටමින් දී ඇති උපදෙස් අනුව නිර්මාණාත්මකව සංවිධානය කිරීමේ වගකීම ඔබ වෙත පවරමි.

සී.ඩී.කළුආරච්චි

අධ්‍යක්ෂ ජනරාල්

පිටපත්

01. ලේකම්, කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය - කා.දැ.ගැ.ස.

02. ප්‍රධාන ගණකාධිකාරි, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව - දැ.ගැ.ස. හා අ.ක.ස.

03. ප්‍රධාන අභ්‍යන්තර විගණක, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව - අ.ක.ස.

04. අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය), සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව - අ.ක.ස.

05. සහකාර අධ්‍යක්ෂ(සමාජ සංවර්ධන) සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව - අ.ක.ස.

06. සභාපති, සමෘද්ධි ජාතික සමාජ සංවර්ධන අරමුදල - දැ.ගැ.ස.

ඇමුණුම 01

දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ.

........................................

## සිංහල හා හින්දු අළුත් අවුරුදු උත්සවය

## මාර්ග ධාවන තරග ප්‍රතිඵලය

| | | | | |
|---|---|---|---|---|
| අනු අංකය | බැංකු සමිතියේ නම | සමෘද්ධි ප්‍රජාමූල බැංකුවේ නම | ජයග්‍රාහී තරගකරුගේ තොරතුරු | |
| | | | නම | දුරකතන අංකය |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |

සකස් කලේ

.....................................

සමාජ සංවර්ධන සහකාර නිලධාරි

නිවැරදි බව තහවුරු කරමි.

..................................................

ප්‍රජාමූල බැංකු සමිති කළමණාකරු

**මත් විරෝධී සමෘද්ධි මාර්ග ධාවන තරඟය**

මූල්‍ය ප්‍රතිපාදන වෙන් කිරීම

| අනු අංකය | දිස්ත්‍රික්කය | මුදල් වෙන් කිරීම | | | දිස්ත්‍රික්කයට වෙන් කළ මුළු මුදල රු. A+ B |
|---|---|---|---|---|---|
| | | බැංකු සංඛ්‍යාව අනුව | A රු. | B රු. | |
| 1 | කොළඹ | 42 X 1,000/- | 42,000/- | 50,000/- | 92,000.00 |
| 2 | ගම්පහ | 88 X 1,000/- | 88,000/- | 50,000/= | 138,000.00 |
| 3 | කළුතර | 56 X 1,000/- | 56,000/- | 50,000/= | 106,000.00 |
| 4 | මහනුවර | 91 X 1,000/- | 91,000/- | 50,000/= | 141,000.00 |
| 5 | මාතලේ | 40 X 1,000/- | 40,000/- | 50,000/= | 90,000.00 |
| 6 | නුවරඑළිය | 35 X 1,000/- | 35,000/- | 50,000/= | 85,000.00 |
| 7 | ගාල්ල | 69 X 1,000/- | 69,000/- | 50,000/= | 119,000.00 |
| 8 | මාතර | 50 X 1,000/- | 50,000/- | 50,000/= | 100,000.00 |
| 9 | හම්බන්තොට | 42 X 1,000/- | 42,000/- | 50,000/= | 92,000.00 |
| 10 | යාපනය | 33 X 1,000/- | 33,000/- | 50,000/= | 83,000.00 |
| 11 | මන්නාරම | 10 | | 50,000/= | 50,000.00 |
| 12 | මුලතිව් | 14 X 1,000/- | 14,000/- | 50,000/= | 64,000.00 |
| 13 | වව්නියාව | 10 | | 50,000/= | 50,000.00 |
| 14 | කිලිනොච්චි | 8 | | 50,000/= | 50,000.00 |
| 15 | මඩකලපුව | 31 X 1,000/- | 31,000/- | 50,000/= | 81,000.00 |
| 16 | ත්‍රිකුණාමලය | 19 X 1,000/- | 19,000/- | 50,000/= | 69,000.00 |
| 17 | අම්පාර | 45 X 1,000/- | 45,000/- | 50,000/= | 95,000.00 |
| 18 | කුරුණෑගල | 120 X 1,000/- | 120,000/- | 50,000/= | 170,000.00 |
| 19 | පුත්තලම | 48 X 1,000/- | 48,000/- | 50,000/= | 98,000.00 |
| 20 | අනුරාධපුරය | 55 X 1,000/- | 55,000/- | 50,000/= | 105,000.00 |
| 21 | පොළොන්නරුව | 23 X 1,000/- | 23,000/- | 50,000/= | 73,000.00 |
| 22 | බදුල්ල | 47 X 1,000/- | 47,000/- | 50,000/= | 97,000.00 |
| 23 | මොණරාගල | 27 X 1,000/- | 27,000/- | 50,000/= | 77,000.00 |
| 24 | රත්නපුරය | 46 X 1,000/- | 46,000/- | 50,000/= | 96,000.00 |
| 25 | කෑගල්ල | 44 X 1,000/- | 44,000/- | 50,000/= | 94,000.00 |
| **එකතුව** | | **1093** | **1,065,000/-** | **1,250,000/=** | **2,315,000/-** |

අධ්‍යක්ෂ ජනරාල්

සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව.

## මත් විරෝධී සමෘද්ධි මාර්ග ධාවන තරඟය

## ................ දිස්ත්‍රික් ප්‍රතිඵල ලේඛණය.

| දිනා ගත් ස්ථානය | බැංකු සමිතියේ නම | සමෘද්ධි ප්‍රජාමූල බැංකුවේ නම | ජයග්‍රාහී තරගකරුවන්ගේ තොරතුරු | |
|---|---|---|---|---|
| | | | නම | දුරකතන අංකය |
| ප්‍රථම | | | | |
| දෙවන | | | | |
| තෙවන | | | | |

සකස් කලේ

................................................

දිස්ත්‍රික් සමාජ සංවර්ධන සහකාර නිලධාරි

පරීක්ෂා කලේ

........... ..................................................

දිස්ත්‍රික් ප්‍රජාමූල විෂයභාර කළමණාකරු

ඉහත තොරතුරු නිවැරදි බව සහතික කරමි.

................................................................

දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ